උ ප රා සේ කො සභා චක්‍රලේඛ අංක **04/2019 (01)**

මගේ අංකය NP/07/10/021/123
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
යාපනය.
**10.05.2019**

ලේකම්, මුදල්, සැලසුම් ක්‍රියාත්මක හා පළාත් පාලන අමාත්‍යාංශය,

කොමසාරිස් පළාත් පාලන දෙපාර්තමේන්තුව,

ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්, ප්‍රා,ප.පා.ස.කො.කාර්යාල,

කොමසාරිස්, මහ නගර සභාව, ලේකම්වරුන් :- නගර සභා හා ප්‍රාදේශීය සභා,

උතුරු පළාත.

**උතුරු පළාත් රාජ්‍ය සේවයේ ආදායම් පරීක්ෂක III වන ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2019**

ඉහත විෂය සම්බන්ධයෙන් මගේ සමාංකය සහිත 18.03.2019 දින දරණ අංක 04/2019 චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

1. ඡේද 03.4 පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ. **අධ්‍යාපන පොදු සහතික (සා/පෙ) විභාගයෙන් වාර දෙකකට නොවැඩිව විෂයයන් දෙකක විශිෂ්ඨ සම්මාන සාමාර්ථයන් සමග භාෂාව (දෙමළ/සිංහල/ඉංග්‍රීසි) හා ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හයක් (06) සමත්වී තිබිය යුතුයි.**
2. 03.5 වන ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ. **2019.05.28 වැනි** දිනට පූර්වාසන්න වසර පහක **(05)** කාලපරිච්ඡේදය තුළ අඛණ්ඩව හා තෘප්තිමත් ලෙස සේවය කර තිබිය යුතු අතර එය දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කළ යුතුයි.
3. එමෙන්ම අදාළ චක්‍රලේඛයේ ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනය **28.05.2019** දක්වා දීර්ඝ කර ඇත.
4. තවද අදාළ විභාගය **2019 වර්ෂයේ ජූනි මස හෝ ජූලි මස** පැවැත්වීමට නියමිත බවත් චක්‍රලේඛයේ සඳහන් අනෙක් කරුණුවල වෙනසක් නොවන බවත් දන්වා සිටිමි.

   මෙම කරුණු ඔබගේ අමාත්‍යාංශයට හා දෙපාර්තමේන්තුවට අයත් සුදුසුකම් ඇති අයදුම්කරුවන් දැනුවත් කරන ලෙස ඉල්ලා සිටින අතර ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනට ප්‍රථම ඉල්ලුම්පත්‍ර යොමු කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි.

***අ. සිවබාලසුන්දරන්***
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
10.05.2019

**පිටපත් :** 1. ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාංශය - උතුරු පළාත. - දැ.ගැ.ස.

2. ආණ්ඩුකාරවර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාංශය - උතුරු පළාත. - දැ.ගැ.ස.